ධර්මදානය පිණිස යි.

# ධම්මානුස්සති භාවනාව

සංස්කාරක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

# ධම්මානුස්සති භාවනාව

**සංස්කාරක**

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

ප්‍රථම මුද්‍රණය : වෙසක්/2552 (2008 මැයි)

Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2008

## *ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්මග්‍රන්ථ*

- අසිරිමත් දනය - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- සුපිරිසිදු නිවන් මග - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- ධම්මචක්කපවත්තන සූත්‍රය සහ අමාදම්ඇස පහළ වීම - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- ආනාපානසති භාවනාව - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- සෙත් පිරිත් සහ තෙසැත්තෑඤණ වන්දනාව - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- මහාසාරෝපම සූත්‍රය - පූජ්‍ය නාවල ධම්මානන්‍ද ස්වාමීන් වහන්සේ.
- ධාතුමනසිකාර භාවනාව - පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ.
- නවසීවථික භාවනාව - පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ.
- බුද්ධානුස්සති භාවනාව - පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ.
- පරාභව සූත්‍රදේශනාව සහ මහාමඞ්ගල සූත්‍රදේශනාව - බන්දුල ආනන්ද පෙරේරා.

නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.**

**Tel** : 071-4417813
**E-mail** : info@sadaham.net
**Web** : www.sadaham.net

# <u>ධර්මදානය සඳහා දායකත්වය</u>

* පින්වත් **W. M** සිරිපාල උපාසක මහතා, ප්‍රේමා ලියනගේ උපාසිකා මාතාව, සෙනෙවිරත්න උපාසිකා මාතාව, ජයකොඩි උපාසිකා මාතාව, පුෂ්පලතා උපාසිකා මාතාව, ඩිලානි මෙනෙවිය, සෝමා උපාසිකා මාතාව යන පින්වතුන් විසින් සියලු ලෝසතුන්ට කරුණාවෙන් යුතු ව භාවනා උපදෙස් දෙමින් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා වූ අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ, පූජ්‍ය ගලගෙදරගම බෝධිධම්ම ස්වාමීන් වහන්සේ, පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ ඇතුළු සියලු ම කල්‍යාණමිත්‍රයන් වහන්සේලාට නිදුක් නිරෝගී චිරජීවනයත් සසර අතරමං ව සිටින බොහෝදෙනාට පිහිට වීමට ශක්තිය ධෛර්යය මෙන් ම ප්‍රාර්ථනීය බෝධියකින් නිර්වාණය සාක්ෂාත් කිරීමට ආශිර්වාද පිණිස මෙම ධර්මදානය සිදු කරන ලදී.

--*--


**ප්‍රකාශනය**

**ශ්‍රී සද්ධර්ම සංසදය**

**ධම්මාරාම යෝගාශ්‍රමය**

**රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.**

**විමසීම්:-** 071 - 4417813

**E-mail :** info@sadaham.net

**Website:** www.sadaham.net

පිටු සැකසීම හා මුද්‍රණය

e-Artefacts Technologies

**305/5, Hansagiri Road, Gampaha.**

**Tel: 071-4417813, 077-3021777**

**Web: www.eartefacts.com**

# පෙරවදන

බුදුසසුනක කටයුතු වනාහි පර්යාප්තිය ය, ප්‍රතිපත්තිය ය, ප්‍රතිවේධය යැ'යි තෙවදෑරුම් ය. ධර්ම-විනය හැදෑරීම පර්යාප්තිය යි. හදාරණ ලද ධර්ම-විනයට අනු ව පිළිවෙත්හි නියැළීම ප්‍රතිපත්තිය යි. ප්‍රතිපත්තීන්හි නියැළීමෙන් ඉහාත්ම වශයෙන් ම ලැබෙන ප්‍රතිඵලය ප්‍රතිවේධය යි.

ප්‍රතිපත්තියෙහි ලා ගැනෙන භාවනා සම්බන්ධ 'ධම්මානුස්සති භාවනාව' වනාහි ධර්මරත්නයෙහි ගුණ අවබෝධාත්මක ව සිහි කරන උසස් භාවනා අභ්‍යාසයෙකි. අද සමාජය තුළ එබඳු භාවනා ක්‍රම පැහැදිලි ව කියා දීම එසේ මෙසේ අයෙකු විසින් කළ හැක්කක් නො වේ ම ය.

පූජ්‍යපාද ධම්මානන්ද යතිවරයන්ගේ ධම්මානුස්සති භාවනාව නම් මෙම ග්‍රන්ථය පමණින් නම් කුඩා ය. අන්තර්ගතය විශාල ම ය. එය තත්කතෘහුගේ ලේඛනපටුත්වය යි. මෙම ග්‍රන්ථය පූජ්‍යපාද ධම්මානන්ද හිමිපාණන් අතින් ම සංගෘහිත බව භාවනාභිනන්දිත ඔබගේ භාග්‍යය යි.

**මේ වගට ශාසනස්ථිතිකාමී,**

**නුවරඑළියේ ඤාණසීල ස්ථවිර වම්හ.**

**රණගිරිය අරණ්‍ය සේනාසනය**
**දේවගිරිය,**
**දිද්දෙණිය,**
**මැල්සිරිපුර.**

# හැඳින්වීම

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කළා වූ ද දේශනා කළා වූ ද සපර්යාප්තික නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මරත්නයෙහි ගුණ සිහි කිරීම් වශයෙන් සිදු කරන අනුස්සති භාවනාව 'ධම්මානුස්සති භාවනාව' යි. ධම්මානුස්සති භාවනාව වඩනු කැමති සත්පුරුෂයන්ට අත්වැලක් වන මෙම කුඩා ධර්මග්‍රන්ථය සංග්‍රහ කරන්නට යෙදුණේ හෙණ්ඩිමහර පින්වත් මාලනී ලියනගේ මාතාවගේ ආරාධනාව අනුව ය. ලියනගේ මාතාව විසින් ලබා දෙනු ලැබූ හේනේගම භාවනා මධ්‍යස්ථානයේ භාවනා වැඩසටහන්වල දී යෝගාවචර පිරිසට ලබා දුන් 'ධම්මානුස්සති' භාවනාව උපදේශ පත්‍රිකා පෙළ මෙම සංස්කරණය සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කරන ලදී. එම භාවනා උපදේශ පත්‍රිකා සකස් කළ අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේට මෙම ධර්මදානමය කුසලයේ ප්‍රථම භාගය අත්පත් වේවා!

එසේ ම මෙම ධර්මදානමය කුසලය සම්බුදුසසුනේ චිරස්ථිතිය සඳහා ද ඒකාන්තයෙන් ම හේතුවාසනා වේවා'යි ප්‍රාර්ථනා කරන අතර ම මෙම ධර්මසංග්‍රහය සකස් කිරීමට ආරාධනා කළ පින්වත් මාලනී ලියනගේ මාතාවට හා සිරිපාල උපාසක මහතාට මෙම ධර්මදානමය කුසලය නිර්වාණාවබෝධය පිණිස හේතු වේවා'යි ආශිංසනය කරමි.

මෙම ධර්මසංග්‍රහය සම්පාදනය කිරීමෙන් අප විසින් ජනිත කර ගත් ධර්මදානමය කුසලය අපගේ පරම පූජනීය උපාධ්‍යායන් වහන්සේ වූ අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක ශ්‍රී ආර්යවිලාසවංසාලංකාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේට අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපවත් වී වදාළ ප්‍රව්‍රජ්‍යාචාර්ය අතිගරු කිතුලම්පිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලය අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපගේ වත්මන් ගෞරවණීය උපාධ්‍යායන් වහන්සේ වන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහෝපාධ්‍යාය, බුත්තල-බුදුගල්ලෙණ අරණ්‍ය සේනාසනාධිවාසි අතිගරු පූජනීය මාවතගම ගුණානන්දාභිධාන මාහිමිපාණන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලයේ බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම කුසලය ද උපනිශ්‍රය වේවා!

මෙබඳු ධර්මග්‍රන්ථ සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රැතමයඥානය දියුණු කර ගැනීම සඳහාත් ගැටමුසු තැන් නිරවුල් කර ගැනීම සඳහාත් මාහට පිහිට වූ ද තමන් වහන්සේගේ ඇසුරට පත්වූවන්ව කාරුණික අවවාදයෙන් මෙන් ම ආදර්ශයෙන් සුමගට යොමු කරන්නා වූ ද ශීල - ශ්‍රැත - ප්‍රඥා - චතුර දේශනා විලාසාදි ප්‍රසාදනීය ගුණස්කන්ධයකින් හෙබියා වූ ද ගිලන් ව සිටිමින් පවා ඉතා ඉවසීමෙන් හා කරුණාවෙන් යුතු ව ධර්මය කියා දෙමින් අපගේ දහම් පවස නිවන්නා වූ ද වත්මන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති මහාධර්මකථික ත්‍රිපිටකාචාර්ය මහාකම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේට මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් නිදුකින් වැඩසිටීමට ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම කුසලය ද උපනිශ්‍රය වේවා!

විවිධාකාරයෙන් මාහට උපකාර කරන පොල්ගස්ඕවිට, දික්හේන, භාවනා මධ්‍යස්ථානයෙහි අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේට ද දනවුකන්ද සිරි මංගල යෝගාශ්‍රමාධිවාසි පූජනීය ගලගෙදරගම බෝධිධම්ම ස්වාමීන් වහන්සේට ද පූජනීය ශ්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේට ද දිද්දෙණිය, රණගිරිය අරණ්‍ය සේනාසනාධිවාසි

පූජ්‍ය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන් වහන්සේට ද පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය සම්පත් හා නිවන් සුව අත්පත් වේවා!

හැදූවැඩූ මවුපිය දෙදෙනා වහන්සේටත් සිවුපසයෙන් උපස්ථාන කරන දායකකාරකාදි සැමටත් විශේෂයෙන් ම මෙම ග්‍රන්ථයේ පරිගණක මුද්‍රණ කටයුතු සිදු කළ පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතාටත් උපේක්‍ෂා පියරංගිකා මෙණෙවියටත් මුද්‍රණයට දායක වූ සැමටත් මෙම ධර්මදානමය කුසල කර්මයේ බලයෙන් ධර්මඥාන, භාවනාඥාන වර්ධනය කර ගෙන සුව සේ නිවන් සුව අත්විඳීමට ලැබේවා!

මෙම ධර්මදානමය කුසල කර්මය සදේවකලෝකයාට ද නිර්වාණාවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

**මෙයට,**

**සසුන් ලැදි,**

**පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි.**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**උග්ගල්බොඩ,**
**ගම්පහ.**
**(වෙසක් - 2552)**

<u>පටුන</u>


| | | |
|---|---|---|
| 1. | ධම්මානුස්සති භාවනාව | 09 |
| 2. | ධම්මානුස්සති භාවනාවෙන් ලැබෙන ආනිසංස | 15 |
| 3. | ධම්මානුස්සති භාවනා වාක්‍ය | 16 |
| 4. | කර්මස්ථානය (දහම්ගුණ මෙනෙහි කිරීම) | 26 |
| 5. | ධම්මානුස්සතියෙන් විදර්ශනාවට | 28 |

# 1. ධම්මානුස්සති භාවනාව

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ වදාළ 'අනුස්සති' භාවනා-කර්මස්ථාන අතරින් දෙවැන්න වන්නේ 'ධම්මානුස්සති' භාවනාව යි. ශ්‍රී සද්ධර්මරත්නයෙහි ගුණ නැවත නැවතත් සිහි කරමින් භාවනා මනසිකාරයෙහි යෙදීම ධම්මානුස්සති භාවනාව යි. ශ්‍රී සද්ධර්මයෙහි ගුණ අප්‍රමාණ ය. එම අප්‍රමාණ දහම්-ගුණ සර්වඥයන් වහන්සේ විසින් ගුණ පද හයකට සංග්‍රහ කර දක්වා ඇත. ධම්මානුස්සති භාවනාවෙහි යෙදෙන යෝගාවචරයා විසින් එම දහම්-ගුණ පද හය විස්තර වශයෙන් දැන ගෙන සිටීම ධම්මානුස්සති භාවනාව සඳහා අතිශයින් ප්‍රයෝජනවත් ය. එම දහම්-ගුණ සය පිළිබඳ විස්තර මෙසේ යි.

"ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී'ති"

**1). <u>ස්වාක්ඛාත</u> :-** ශ්‍රී සද්ධර්මය මනාකොට දේශිත බැවින් ස්වාක්ඛාත නම් වේ. මෙම ගුණයට පර්යාප්ති හෙවත් උගත යුතු දහම් සියල්ල ම, එනම් නවාංග ශාස්තෘශාසනය (ත්‍රිපිටක බුද්ධවචනය) ද නව-ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ද ඇතුළත් වේ. සෙසු ගුණ පහෙන් කියැවෙන්නේ ලෝකෝත්තර ධර්මයෙහි ගුණ ය. නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම නමින් හැඳින්වෙන්නේ සෝතාපත්ති ආදි මාර්ග සතර, ඵල සතර හා නිවන ය.

පර්යාප්ති ධර්මය වනාහි මුල - මැද - අග යහපත් ව (ආදිකල්‍යාණ, මජ්ඣෙකල්‍යාණ, පරියෝසානකල්‍යාණ වශයෙන්) දේශිත බැවින් ද අර්ථ ව්‍යඤ්ජනයෙන් පිරිපුන් ව පිරිසිදු බඹසර ප්‍රකාශිත වන බැවින් ද එම (පර්යාප්ති ධර්මය) <u>ස්වාක්ඛාත</u> නම් වේ. [පර්යාප්ති ධර්මයෙහි ස්වාක්ඛාත බව විසුද්ධිමග්ගයෙහි විවිධ න්‍යායන්ගෙන් විස්තර වේ. සතර-පද ගාථාවක පළමු

පාදය 'ආදිකල්‍යාණ' ය. දෙවැනි, තෙවැනි පාද 'මජ්ඣෙකල්‍යාණ' ය. සිවුවැනි පාදය 'පරියෝසානකල්‍යාණ' ය. ඒකානුසන්ධික සූත්‍රයක නිදානය 'ආදිකල්‍යාණ' ය. නිගමනය 'පරියෝසානකල්‍යාණ' ය. සෙස්ස 'මජ්ඣෙකල්‍යාණ' ය. බොහෝ අනුසන්ධි ඇති සූත්‍රයක පළමු අනුසන්ධි ය 'ආදිකල්‍යාණ' ය. අවසාන අනුසන්ධිය 'පරියෝසානකල්‍යාණ' ය. මැද අනුසන්ධි 'මජ්ඣෙකල්‍යාණ' ය. නිදාන උත්පත්ති සහිත බැවින් 'ආදිකල්‍යාණ' ය. හික්මවිය යුතු ජනයාට සුදුසු වන ලෙස අර්ථය විපරීත නො වන ලෙස දේශිත හේතු, උදාහරණවලින් යුක්ත බැවින් 'මජ්ඣෙකල්‍යාණ' ය. දේශනාව අවසානයෙහි ශ්‍රාවකයන් තුළ ශ්‍රද්ධාව ඇති වන බැවින් ද නිගමනයෙන් යුක්ත බැවින් ද 'පරියෝසානකල්‍යාණ' ය. මුළුමහත් ශාසන ධර්මය ම තමාගේ යහපත පිණිස හේතු වන ශීලයෙන් යුක්ත බැවින් 'ආදිකල්‍යාණ' ය. සමථ - විදර්ශනා - මාර්ග - ඵලවලින් යුක්ත බැවින් 'මජ්ඣෙකල්‍යාණ' ය. අවසානයෙහි දී නිවන සාක්ෂාත් කරන බැවින් 'පරියෝසානකල්‍යාණ' ය. නැතහොත් ශීල, සමාධි දෙක 'ආදිකල්‍යාණ' ය. විදර්ශනාව හා මාර්ගය 'මජ්ඣෙකල්‍යාණ' ය. ඵල හා නිවන 'පරියෝසානකල්‍යාණ' ය. නැතහොත් බුද්ධසුබෝධිතාවෙන් (ශාස්තෲන් වහන්සේ සර්වඥ බැවින්) 'ආදිකල්‍යාණ' ය. ධර්මසුධර්මත්වයෙන් 'මජ්ඣෙකල්‍යාණ' ය. සංඝසුපටිපන්නතාවෙන් 'පරියෝසානකල්‍යාණ'ය. පළමුවෙන් ධර්මය අසා අනතුරු ව ඒ අනුව පිළිපැද සාක්ෂාත් කළ යුතු අභිසම්බෝධියෙන් යුක්ත වන බැවින් 'ආදිකල්‍යාණ' ය. පච්චේකබෝධියේ වශයෙන් 'මජ්ඣෙකල්‍යාණ' ය. ශ්‍රාවකබෝධියේ වශයෙන් 'පරියෝසානකල්‍යාණ' ය. ධර්මය ශ්‍රවණය කරන විට නීවරණ සන්සිඳී යන බැවින් ධර්මය ඇසීම් පමණින් ම යහපත උදාවන බැවින් 'ආදිකල්‍යාණ' ය. ධර්මය පිළිපදින්නහුට සමථ - විදර්ශනා වශයෙන් මානසික සුවයෙන් යහපත සැලසෙන බැවින් 'මජ්ඣෙකල්‍යාණ' ය. ප්‍රතිපදාව සම්පූර්ණ කිරීමෙන් උතුම් නිවන් සැප සැලසෙන බැවින් 'පරියෝසානකල්‍යාණ' ය. මෙසේ මුල - මැද - අග යහපත් බැවින් ශ්‍රී සද්ධර්මය ස්වාක්ඛාත නම් වේ.]

නව-ලෝකෝත්තර ධර්මය වනාහි නිවන් අවබෝධ කිරීමට නිසි ප්‍රතිපදාවෙන් යුක්ත බැවින් ද එම ධර්මානුධර්මප්‍රතිපදාවට අනුරූප වූ නිර්වාණාවබෝධයෙන් යුක්ත බැවින් ද ස්වාක්ඛාත නම් වේ. කාමසුඛල්ලිකානුයෝග - අත්තකිලමථානුයෝග යන අන්ත ද්වයට නො පැමිණ මධ්‍යමප්‍රතිපදාවෙන් ආර්ය-මාර්ගය දේශිත බැවින් ද ස්වාක්ඛාත නමි. නිත්‍ය - මංගල - පරම - සුන්දර නිර්වාණ ධර්මය එනයින් ම වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වේ. මෙසේ පර්යාප්ති-ධර්මය මෙන් ම නව-ලෝකෝත්තර ධර්මය ද ස්වාක්ඛාත වේ.

තව ද, භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන කල්හි ශාසන බ්‍රහ්මචරියාව ද මාර්ග බ්‍රහ්මචරියාව ද නොයෙක් ආකාරයෙන් පැහැදිලි කරන සේක. එහි ලා අර්ථ සම්පත්තියෙන් යුක්ත බව 'සාත්ථ' නමි. ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බව 'සව්‍යඤ්ජන' නමි.

සඞ්කාසන (සැකෙවින් කීම) - පකාසන (ප්‍රථමයෙන් කීම) - විවරණ (සැකෙවින් කී දේ විස්තර කිරීම) - විභජන (වරක් කී දේ නැවත කීම) - උත්තානීකරණ (විවරණය කළ දේ වඩාත් විස්තර කිරීම) - පඤ්ඤත්ති (විස්තර කරන ලද්ද නොයෙක් අයුරින් දක්වමින් ශ්‍රවණය කරන්නාගේ සතුට වැඩීම) යනාදි වශයෙන් අර්ථ-පද සමායෝගයෙන් යුතු බැවින් 'සාත්ථ' නමි. අක්ඛර (පදයක අවයව) - පද (විභක්ත්‍යන්ත පදය) - ව්‍යඤ්ජන (පද සමූහයකින් සැදෙන වාක්‍යය) - ආකාර (වාක්‍යය නොයෙක් අයුරින් බෙදා දැක්වීම) - නිරුත්ති (අර්ථය ගෙන හැර කීම) - නිද්දේස (අර්ථය නිරවශේෂයෙන් දැක්වීම) යන ව්‍යඤ්ජන සම්පත්ති සහිත බැවින් සව්‍යඤ්ජන ය.

තව ද අර්ථ-ගම්භීර, ප්‍රතිවේධ-ගම්භීරතාවෙන් යුතු බැවින් 'සාත්ථක' ය. ධර්ම-ගම්භීර, දේශනා-ගම්භීරතාවෙන් යුතු බැවින් 'සව්‍යඤ්ජන' ය. අත්ථපටිසම්පදා -පටිභානපටිසම්පදාවන්ට අරමුණු වන බැවින් 'සාත්ථක' ය. ධම්මපටිසම්පදා - නිරුත්තිපටිසම්පදාවන්ට අරමුණු වන බැවින් 'සව්‍යඤ්ජන' ය. නුවණැති ජනයා විසින් අවබෝධ කළ යුතු බැවින් ද විමර්ශනයෙහි යෙදෙන්නන්ට ප්‍රසාදය ගෙන දෙන බැවින් ද 'සාත්ථක'ය. ඇදහිය යුතු බැවින් ද ලෞකික ජනයාට ප්‍රසාදය

ගෙන දෙන බැවින් ද 'සව්‍යඤ්ජන'ය. ගැඹුරු අදහස් ඇති බැවින් 'සාත්ථක'ය. නො ගැඹුරු පද ඇති බැවින් 'සව්‍යඤ්ජන'ය. මෙසේ ධර්මය සාත්ථක හා සව්‍යඤ්ජන බැවින් ද ස්වාක්ඛාත නම් වේ.

ස්වාක්ඛාත ගුණයෙහි ම තවත් අංගයක් වන්නේ ශ්‍රී සද්ධර්මයෙහි තිබෙන මුළුමනින් ම පිරුණු (කේවලපරිපුණ්ණ) බව යි. ධර්මයෙහි නො කියන ලද අමුතුවෙන් ඇතුළත් කළ යුතු අර්ථයක් නැති බව ය, එයින් අදහස් කෙරෙනුයේ. එමෙන් ම ඉවත් කළ යුතු අපිරිසිදු යමක් නැති බැවින් නිර්දෝෂී බැවින් 'පරිසුද්ධ' නම් වේ. මෙම ගුණ සහිත අධිශීල - අධිචිත්ත - අධිප්‍රඥා යන ත්‍රිශික්ෂාවෙන් යුතු ආර්ය-මාර්ගය 'බ්‍රහ්මචරිය' නම් වේ.

තව ද ශ්‍රී සද්ධර්මය වනාහි අවබෝධයට නිසි ගුණයෙන් යුතු බැවින් 'සාත්ථක' ය. පර්යාප්ති ධර්මය ආගම ව්‍යක්ත ගුණයෙන් යුතු බැවින් 'සව්‍යඤ්ජන' ය. ශීලාදි ධර්මස්කන්ධ පසින් යුතු බැවින් මුළුමනින් සම්පූර්ණ ය. කෙලෙස් දුරු කරමින් සසරින් එතෙරවීම පිණිස පවතින බැවින් පිරිසිදු ය. මෙබඳු ගුණයන්ගෙන් යුතු ව ශීල-සමාධි-ප්‍රඥා සංඛ්‍යාත මාර්ග බ්‍රහ්මචරියාව ප්‍රකාශිත බැවින් ද ධර්මය ස්වාක්ඛාත නම් වේ. අන්‍ය ආගම් දර්ශන විපරීත අර්ථයන්ගෙන් යුක්ත බැවින් දුරක්ඛාත ය. එහෙත් ශ්‍රී සද්ධර්මය වනාහි අර්ථ විපරීත බවකින් තොර ව සර්වඥයන් වහන්සේ විසින් ම දේශිත බැවින් ද ස්වාක්ඛාත නම් වේ.

ශ්‍රී සද්ධර්මයේ ස්වාක්ඛාත ගුණය විස්තර වශයෙන් මෙසේ අවබෝධ කර ගත යුතු ය.

**2). සන්දිට්ඨික :-** තමා විසින් ම මේ ජීවිතයෙහි දී ම ස්වසන්තානයෙන් ම ප්‍රත්‍යක්ෂ කළ යුතු බැවින් සන්දිට්ඨික නම් වේ.

✶ ආර්යයන් වහන්සේලා විසින් ස්වසන්තානගත රාගාදි කෙලෙසුන් දුරු කරමින් තමා විසින් ම ධර්මය අවබෝධ කරන බැවින් ද (සාමං දට්ඨබ්බෝ) ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික නම් වේ.

✶ මාර්ග සතර ය, ඵල සතර ය, 'නිවන' ය යන නව-

ලෝකෝත්තර ධර්මය අවබෝධ කර ගන්නා උතුමන් විසින් අනුන් අනුව ඇදහීමකින් තොර ව තමාගේ ප්‍රත්‍යවේක්ෂාඥානයෙන් ම එය දැනගන්නා බැවින් ද (සයං දට්ඨබ්බෝ) ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික නම් වේ.

✶ ප්‍රශස්ත වූ දෘෂ්ටිය 'සන්දිට්ඨි' නමි. එම 'සන්දිට්ඨිය' කරණ කොට පස්මරුන් පරදවා ජය ලබන බැවින් නව - ලෝකෝත්තර ධර්මය 'සන්දිට්ඨික' නම් වේ. මෙසේ සම්ප්‍රයුක්ත සන්දිට්ඨියෙන් යුතු ව ආර්ය-මාර්ගයෙන් කෙලෙස් නසා ජය ගනු ලැබේ. ඵලය පිණිස හේතු වූ සන්දිට්ඨියෙන් යුතු ව ආර්ය ඵලයෙන් ද කෙලෙස් නසා ජය ගනු ලැබේ. නිවන අරමුණු කොට ඇති සන්දිට්ඨියෙන් යුතු ව කෙලෙස් පරදවා ජය ලබන බැවින් නිවන ද 'සන්දිට්ඨික' ය. මෙසේ සන්දිට්ඨියෙන් යුතු ව ජය ලබන බැවින් (සන්දිට්ඨියා ජයති) සන්දිට්ඨික නම් වේ.

✶ දර්ශනයට 'දිට්ඨ' ය යි කියනු ලැබේ. මනා ව දැකීමට යෝග්‍ය බව 'සන්දිට්ඨ' නමි. ලෝකෝත්තර මාර්ගය (සතර මාර්ග) දියුණු කර ගැනීම් (භාවනාභිසමය) වශයෙන් මනා දර්ශනයෙන් යුතු වන බැවින් ද ඵල සතර හා නිවන ප්‍රත්‍යක්ෂ කිරීම් (සච්ඡිකිරියාභිසමය) වශයෙන් මනා දර්ශනයෙන් යුතු වන බැවින් ද සියලු සසර දුක් අවසන් වේ. මෙසේ මනා දර්ශනයට සුදුසු බැවින් සන්දිට්ඨික ය.

ශ්‍රී සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය මෙසේ අවබෝධ කර ගත යුතු ය.

**3).** අකාලික **:-** කල් නො යවා විපාක දෙන බැවින් අකාලික නම් වේ. සෝතාපන්න, සකදාගාමී ආදි මාර්ග සිත් සතරට අනතුරු ව ම එහි ඵල සිත ද ලැබේ. මෙය ලෝකෝත්තර ධර්මයන්ට ම විශේෂිත වූ ධර්මතාවකි. ලෞකික කුසල ධර්මයන්හි විපාක ලැබීමට යම් කිසි කාලයක් ගත වේ. එහෙත් ලෝකෝත්තර මාර්ගයන් පිළිබඳ ව එසේ නො වී මාර්ගයට අනතුරු ව ම (සමනන්තර) ඵලය ලැබෙන බැවින් එය අකාලික නම් වේ.

**4).** ඒහිපස්සික **:-** 'පැමිණ මෙම ධර්මතාව නුවණින් දකින්නැ'යි කීමට සුදුසු බැවින් ශ්‍රී සද්ධර්මය 'ඒහිපස්සික' නම් වේ. මේ

ශ්‍රී සද්ධර්මය 'පැමිණ බලන්නැ'යි කියන විධානයට සුදුසු වන්නේ කුමක් නිසා ද? ලෝකෝත්තර ධර්මයන්ගේ තිබෙන විද්‍යමානත්වය හා පිරිසිදු බව නිසා ය. හිස් අත මිට මොළවා ගෙන 'පැමිණ රන් බලන්නැ'යි කිව නො හැක. (මිටෙහි කිසිවක් නැති බැවිනි.) මල, මූත්‍ර බඳු දෙයක් විද්‍යමාන වුව ද පැමිණ බලන්නැ'යි කිව නො හැක. (එය අන්‍යයන්ට නො පෙනෙන සේ වසා දැමිය යුතු අපිරිසිදු දෙයක් වන බැවිනි.)

එහෙත් මෙම නව-ලෝකෝත්තර ධර්මය වනාහි වලාකුළු පහවූ අහසෙහි බබළන පුන්සඳමඬල මෙන් විද්‍යමාන ය. රත්පලසක් මත තැබූ ජාතිරංග මාණික්‍යයක් මෙන් පිරිසිදු ය. මෙසේ විද්‍යමාන බැවින් ද පිරිසිදු බැවින් ද යුතු වූ නව-ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඒහිපස්සික ගුණයෙන් යුතු ය.

**5). ඕපනයික :-** සිතෙහි පිහිටුවා ගැනීමට සුදුසු බැවින් ද නිවන කරා පමුණුවන බැවින් ද ඕපනයික නම් වේ.

තම හිසට හෝ ඇඳි-වතට හෝ ගිනි ඇවිළුණ ද ඒ ගැන නො තකා භාවනා කිරීම් වශයෙන් සතර මාර්ග - ඵල ධර්මයන් සිතෙහි පහළ කර ගැනීම කළ යුතු බැවින් ලෝකෝත්තර ධර්මය වනාහි 'උපනෙතබ්බ' අර්ථයෙන් ඕපනයික නම් වේ. අසඞ්ඛත වූ නිවන වනාහි තම සිතින් අරමුණු කිරීම් වශයෙන් එය කරා පැමිණීමට සුදුසු බැවින් 'උපනයන' අර්ථයෙන් ඕපනයික නම් වේ. තව ද ආර්යපුද්ගලයන් නිවන කරා පමුණුවන බැවින් ලෝකෝත්තර ආර්යමාර්ගය 'උපනෙය්‍ය' අර්ථයෙන් ඕපනයික නම් වේ. ආර්යපුද්ගලයන් විසින් ප්‍රත්‍යක්ෂ කළ යුතු බවට, පැමිණ විය යුතු බැවින් ඵල ධර්මයන් හා නිවන ද 'උපනෙය්‍ය' අර්ථයෙන් ඕපනයික නම් වේ. මෙසේ නව-ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඕපනයික නම් වේ.

**6). පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි :-** නුවණැත්තන් විසින් තමාගේ නුවණින් ම අවබෝධ කළ යුතු බැවින් 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' නම් වේ. ශ්‍රී සද්ධර්මය වනාහි උග්ඝටිතඤ්ඤූ ආදි පුද්ගලයන් විසින් 'මා විසින් මාර්ගය වඩන ලදී. ඵලය ලබන ලදී. නිවන ප්‍රත්‍යක්ෂ කරන ලදී' යනුවෙන් තමා තුළින් ම ප්‍රත්‍යක්ෂ කළ යුතු දහමකි. මාර්ග - ඵල - නිර්වාණ

ධර්මයන් වනාහි අනුන් පැළඳි ආභරණයක් සේ සැමට ම පොදුවේ දැක ගන්නට නො ලැබෙන තමා විසින් ම තමා සඳහා ප්‍රත්‍යක්ෂ කළ යුතු ධර්මයෝ ය. ආචාර්යවරයා ප්‍රත්‍යක්ෂ කළ නිවනින් කිසිවිටක ශිෂ්‍යාගේ සන්තානගත කෙලෙස් ප්‍රහාණය නො වේ. තව ද මෙම ශ්‍රී සද්ධර්මය අඥනයන්ට විෂය නො වන නුවණැත්තන්ට ම ප්‍රඥාගෝචර වන දහමක් බැවින් ද 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' නම් වේ.

මෙසේ දහම්ගුණ නැවත නැවතත් සිහි කරන විට එම සන්තානයෙහි පවතින රාග - ද්වේෂ - මෝහාදි අකුසල ධර්මයන් සන්සිඳී යයි. (අනුසය ධර්මයන් ඒ මොහොතෙහි නැඟී නො එයි.) දහම්ගුණ අරමුණු කර ගෙන සිත ඍජු ව ම එදෙසට යොමු ව එකඟ ව පවතී. මෙසේ පඤ්චනීවරණ විෂ්කම්භණය වී යාමෙන් විතක්ක - විචාරාදි පඤ්ච ධ්‍යානාංගයන්ගේ පහළ වීමෙන් උපචාර සමාධියට පත් විය හැකි ය. දහම්ගුණයන්ගේ ගම්භීරත්වය නිසා ද අනේක වූ දහම්ගුණ සිහිකිරීමෙහි යෙදී සිටින නිසා ද උපචාර ධ්‍යානය ඉක්මවා අර්පණා තත්ත්වයට පත්වීමක් ධම්මානුස්සති භාවනාවෙන් සිදු නො වේ.

## 2. ආනිසංස

ධම්මානුස්සති භාවනාව වඩන යෝගාවචරයා ශාස්තෘන් වහන්සේ කෙරෙහි බලවත් ගෞරවයෙන් යුතු ව යටහත් පැවතුම් ඇති ව වාසය කරයි. ධර්මරත්නය කෙරෙහි ද ගෞරවයෙන් යුතු ව බලවත් ශ්‍රද්ධාවක් ඇති කර ගනී. නිතර ප්‍රීති, ප්‍රමෝද බහුල ව වාසය කරයි. බියජනක අරමුණු ඉවසීමට සමත් වේ. දුක් වේදනා ඉවසීමට සමත් වේ. ධර්මය සමඟින් එක් ව විසීමේ සංඥව ලබයි. නිතර ධම්මානුස්සතිය වඩන යෝගාවචරයාගේ ශරීරය ද චෛත්‍යගෘහයක් සේ පූජනීය වේ. අනුත්තර වූ ලෝකෝත්තර ධර්ම සාක්ෂාත් කිරීමට සිත නැමේ. ශික්ෂාපද කඩ කිරීම් ආදි කරුණක් එළැඹි කල්හි ධර්මසුධර්මත්වය සිහි කිරීම තුළින් වහා හිරි-ඔතප් ඇති වීමෙන් එම වරදින් වළකී. මේ ජීවිතය තුළ අර්හත්වයට පත් නො වී නම් ධම්මානුස්සති භාවනාමය කුසලයෙන් නිසැකයෙන් ම සුගතිගාමී වේ.

## 3. ධම්මානුස්සති භාවනා වාක්‍ය

*(අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේගේ දහම්ගුණ භාවනා වාක්‍ය ඇසුරින් සකස් කරන ලදී.)*

### <u>ස්වාක්ඛාත ගුණය</u>

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ විසින් ජයසිරි මහබෝමැඩ දී අවබෝධ කොට වදාළා වූ සපර්යාප්තික නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මුල, මැද, අග යහපත් බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය පර්‍යාප්ති වශයෙන් මුල යහපත් බැවින් ද, ප්‍රතිපත්ති වශයෙන් මැද යහපත් බැවින් ද, ප්‍රතිවේධ වශයෙන් අග යහපත් බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ශීල සම්පදා වශයෙන් මුල යහපත් බැවින් ද, සමාධි සම්පදා වශයෙන් මැද යහපත් බැවින් ද, ප්‍රඥා සම්පදා වශයෙන් අග යහපත් බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ශීල, සමාධි වශයෙන් මුල යහපත් බැවින් ද, විදර්ශනා-මාර්ග වශයෙන් මැද යහපත් බැවින් ද, ඵල-නිර්වාණ වශයෙන් අග යහපත් බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.
6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය බුද්ධසුබෝධිත අර්ථයෙන් මුල යහපත් බැවින් ද, ධර්මසුධර්මතා අර්ථයෙන් මැද යහපත් බැවින් ද, සඞ්ඝසුපටිපන්න අර්ථයෙන් අග යහපත් බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වන්නේ ය.

7. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සම්මාසම්බෝධියෙන් මුල යහපත් බැවින් ද, ප්‍රත්‍යෙකබෝධියෙන් මැද යහපත් බැවින් ද, ශ්‍රාවකබෝධියෙන් අග යහපත් බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

8. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අර්ථ-සම්පත්ති සහිත ව මනා සේ වදාළ බැවින් ද, ව්‍යඤ්ජන-සම්පත්ති සහිත ව මනා සේ වදාළ බැවින් ද, සර්ව සම්පූර්ණ ව මනා සේ වදාළ බැවින් ද, සුපරිශුද්ධ වූ ශාසන බ්‍රහ්මචර්යාව - මාර්ග බ්‍රහ්මචර්යාව මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

9. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සෝතාපත්ති මාර්ග වශයෙන් මනා සේ වදාළ බැවින් ද, සෝතාපත්ති ඵල වශයෙන් මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

10. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සකදාගාමී මාර්ග වශයෙන් මනා සේ වදාළ බැවින් ද, සකදාගාමී ඵල වශයෙන් මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

11. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අනාගාමී මාර්ග වශයෙන් මනා සේ වදාළ බැවින් ද, අනාගාමී ඵල වශයෙන් මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

12. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අර්හත් මාර්ග වශයෙන් මනා සේ වදාළ බැවින් ද, අර්හත් ඵල වශයෙන් මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

13. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අසඞ්ඛතධාතු නිර්වාණය වශයෙන් මනා සේ වදාළ බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.

# <u>සන්දිට්ඨික ගුණය</u>

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ස්වකීය සන්තානයෙහි දැක ගත යුතු බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය කෙලෙසුන් නසමින් පහළ වන, සෝතාපත්ති මාර්ගය ස්වකීය සන්තානයෙහි දැක ගත යුතු බැවින් ද, සකදාගාමී මාර්ගය ස්වකීය සන්තානයෙහි දැක ගත යුතු බැවින් ද, අනාගාමී මාර්ගය ස්වකීය සන්තානයෙහි දැක ගත යුතු බැවින් ද, අර්හත් මාර්ගය ස්වකීය සන්තානයෙහි දැක ගත යුතු බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ප්‍රත්‍යවේක්ෂාඥානයෙන් තමා විසින් ම දැක ගත යුතු බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ප්‍රත්‍යවේක්ෂාඥානයෙන්, සෝතාපත්ති මාර්ගය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, සෝතාපත්ති ඵලය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, සකදාගාමී මාර්ගය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, සකදාගාමී ඵලය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, අනාගාමී මාර්ගය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, අනාගාමී ඵලය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, අර්හත් මාර්ගය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද, අර්හත් ඵලය නම් මේ යැ’යි තමා විසින් ම විසින්ම දැක ගත යුතු බැවින් ද, අසඞ්ඛතධාතු නිර්වාණය නම් මේ යැ’යි තමා විසින් ම දැක ගත යුතු බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.
6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ

ශ්‍රී සද්ධර්මරත්නය සම්මාදිට්ඨියෙන් කෙලෙසුන් ජය ගන්නා බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

**7.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සම්මාදිට්ඨියෙන් සෝතාපත්ති මාර්ගය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, සෝතාපත්ති ඵලය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, සකදාගාමී මාර්ගය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, සකදාගාමී ඵලය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

**8.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සම්මාදිට්ඨියෙන් අනාගාමී මාර්ගය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, අනාගාමී ඵලය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, අර්හත් මාර්ගය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, අර්හත් ඵලය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද, අසඞ්ඛතධාතු නිර්වාණය කෙලෙසුන් ජය ගන්නා බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

**9.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සම්මාදිට්ඨියෙන් දැක ගැනීමට සුදුසු වන බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

**10.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය භාවනාභිසමය වශයෙන්, සෝතාපත්ති මාර්ගය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, සකදාගාමී මාර්ගය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, අනාගාමී මාර්ගය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, අර්හත් මාර්ගය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

**11.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සච්ඡිකිරියාභිසමය වශයෙන්, සෝතාපත්ති ඵලය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, සකදාගාමී ඵලය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, අනාගාමී ඵලය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, අර්හත් ඵලය දැක ගැනීමට සුදුසු වන බැවින් ද, අසඞ්ඛතධාතු නිර්වාණය දැක ගැනීමට සුදුසු වන බැවින් ද <u>සන්දිට්ඨික</u> නම් වන්නේ ය.

# අකාලික ගුණය

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද අකාලික නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සෝතාපත්ති මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, සකදාගාමී මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද අනාගාමී මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, අර්හත් මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද අකාලික නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සුඤ්ඤත මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, අනිමිත්ත මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, අප්පණිහිත මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද අකාලික නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අෂ්ටාඞ්ගික මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, සර්වසඞ්ග්‍රාහික මාර්ග කුසලයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද අකාලික නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ලෝකෝත්තර කුසල ධ්‍යානයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, ලෝකෝත්තර කුසල සතිපට්ඨානයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, ලෝකෝත්තර කුසල සම්‍යක්ප්‍රධානයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද, ලෝකෝත්තර කුසල ඍද්ධිපාදයට අනතුරු ව ම ඵලවිපාක ගෙන දෙන බැවින් ද අකාලික නම් වන්නේ ය.

## <u>ඒහිපස්සික ගුණය</u>

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද <u>ඒහිපස්සික</u> නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ ශීල සම්පදාව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සමාධි-සම්පදාව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ ප්‍රඥා-සම්පදාව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ විමුක්ති-සම්පදාව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ විමුක්තිඥානදර්ශන සම්පදාව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, <u>ඒහිපස්සික</u> නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ සීලවිසුද්ධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ චිත්තවිසුද්ධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ දිට්ඨිවිසුද්ධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ කඞ්ඛාවිතරණවිසුද්ධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ ඤාණදස්සනවිසුද්ධි ය'යි දැක්වීමට සුදුසු වන බැවින් ද <u>ඒහිපස්සික</u> නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ සතර සතිපට්ඨානයෝ ය'යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සතර සම්‍යක්ප්‍රධානයෝ ය'යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සතර ඍද්ධිපාදයෝ ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ පඤ්ච-ඉන්ද්‍රියෝ ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ පඤ්ච-බල ධර්මයෝ ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සප්ත-බොජ්ඣඞ්ගයෝ ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද <u>ඒහිපස්සික</u> නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ සම්මාදිට්ඨි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාසඞ්කප්ප ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාවාචා ය' යි දැක්වීමට සුදුසු වන

බැවින් ද, 'මේ සම්මාකම්මන්ත ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාආජීව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාවායාම ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාසති ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සම්මාසමාධි ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, ඒහිපස්සික නම් වන්නේ ය.

6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ සෝතාපත්ති මාර්ගය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සකදාගාමී මාර්ගය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ අනාගාමී මාර්ගය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ අර්හත් මාර්ගය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද ඒහිපස්සික නම් වන්නේ ය.

7. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මේ සෝතාපත්ති ඵලය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ සකදාගාමී ඵලය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ අනාගාමී ඵලය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ අර්හත් ඵලය ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද, 'මේ අමෘත මහානිර්වාණධාතුව ය' යි දැක්වීමට සුදුසු වන බැවින් ද ඒහිපස්සික නම් වන්නේ ය.

## ඕපනයික ගුණය

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද ඕපනයික නම් වන්නේ ය.

2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය වනාහි කාමච්ඡන්දයට ප්‍රතිපක්‍ෂ වූ නෛෂ්ක්‍රම්‍යය, ව්‍යාපාදයට ප්‍රතිපක්‍ෂ වූ මෛත්‍රිය, ථීනමිද්ධයට ප්‍රතිපක්‍ෂ වූ ආලෝකසඤ්ඤාව, උද්ධච්චයට ප්‍රතිපක්‍ෂ වූ සමාධිය, විචිකිච්ඡාවට ප්‍රතිපක්‍ෂ වූ ධර්මඥානය, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද ඕපනයික නම් වන්නේ ය.

3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අවිද්‍යාවට ප්‍රතිපක්‍ෂ වූ භාවනාඥානය,

අරතියට ප්‍රතිපක්‍ෂ වූ ප්‍රමෝදය, නීවරණ ඉක්මවා යන ප්‍රථමධ්‍යානය, විතක්ක-විචාර ඉක්මවා යන ද්විතීයධ්‍යානය, ප්‍රීතිය ඉක්මවා යන තෘතීයධ්‍යානය, සැප වේදනාව ඉක්මවා යන චතුර්ථධ්‍යානය, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද ඕපනයික නම් වන්නේ ය.

**4.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය වනාහි පඤ්චස්කන්ධය අනිත්‍ය වශයෙන් දකින අනිච්චානුපස්සනාව, පඤ්චස්කන්ධය දුක්ඛ වශයෙන් දකින දුක්ඛානුපස්සනාව, පඤ්චස්කන්ධය අනාත්ම වශයෙන් දකින අනත්තානුපස්සනාව, පඤ්චස්කන්ධය පිළිබඳ ව කලකිරීම් වශයෙන් දකින නිබ්බිදානුපස්සනාව, පඤ්චස්කන්ධය පිළිබඳ ව නො ඇලීම් වශයෙන් දකින විරාගානුපස්සනාව, තමාගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද ඕපනයික නම් වන්නේ ය.

**5.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය වනාහි පඤ්චස්කන්ධය නිරුද්ධ වීම් වශයෙන් දකින නිරෝධානුපස්සනාව, පඤ්චස්කන්ධය අත්හැරීම් වශයෙන් දකින පටිනිස්සග්ගානුපස්සනාව, පඤ්චස්කන්ධය ක්ෂය වීම් වශයෙන් දකින ඛයානුපස්සනාව, පඤ්චස්කන්ධය ව්‍යය වීම් වශයෙන් දකින වයානුපස්සනාව, පඤ්චස්කන්ධය පෙරළීම් වශයෙන් දකින විපරිණාමානුපස්සනාව, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද ඕපනයික නම් වන්නේ ය.

**6.** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය වනාහි පඤ්චස්කන්ධය නිත්‍යය'යි නො ගන්නා වූ අනිමිත්තානුපස්සනාව, පඤ්චස්කන්ධය සැප ය'යි නො ගන්නා වූ අප්පණිහිතානුපස්සනාව, පඤ්චස්කන්ධය ආත්ම ය'යි නො ගන්නා වූ සුඤ්ඤතානුපස්සනාව, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද ඕපනයික නම්

වන්නේ ය.

7. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය පඤ්චස්කන්ධය භංග වශයෙන් අසාර බව දකින අධිපඤ්ඤාධම්මවිපස්සනාව, පඤ්චස්කන්ධය භය වශයෙන් දකින <u>යථාභූතඤාණදස්සනාය</u>, පඤ්චස්කන්ධයෙහි ආදීනව දකින ආදීනවානුපස්සනාව, පඤ්චස්කන්ධය අත්හැරීමේ උපාය වශයෙන් සලකන පටිසඞ්ඛානුපස්සනාව, පඤ්චස්කන්ධය අත්හැර නිවන අරමුණු කරන විවට්ටානුපස්සනාව, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද <u>ඕපනයික</u> නම් වන්නේ ය.

8. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සෝතාපත්ති මාර්ග-ඵල ධර්මයන්, සකදාගාමී මාර්ග-ඵල ධර්මයන්, අනාගාමී මාර්ග-ඵල ධර්මයන්, අර්හත් මාර්ග-ඵල ධර්මයන් අරමුණු කිරීම් වශයෙන් අමෘත මහානිර්වාණධාතුව, තමන්ගේ සිතෙහි උපදවා ගැනීම් වශයෙන් උපනයනය කළ යුතු බැවින් ද <u>ඕපනයික</u> නම් වන්නේ ය.

## <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ගුණය</u>

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය මෙසේ ද <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි</u> නම් වන්නේ ය.

2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් සීලවිසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් චිත්තවිසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් දිට්ඨිවිසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් කඞ්ඛාවිතරණ විසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් පටිපදාඤාණදස්සනවිසුද්ධිය වඩන ලද'යි, 'මා විසින් ඤාණදස්සනවිසුද්ධිය වඩන ලද'යි, කියා නැණවතුන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි</u> නම්

වන්නේ ය.

3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්'යි, 'මා විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ වඩන ලද්'යි, 'මා විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්'යි, 'මා විසින් පඤ්ච-ඉන්ද්‍රිය ධර්මයෝ වඩන ලද්'යි, 'මා විසින් පඤ්ච-බල ධර්මයෝ වඩන ලද්'යි, 'මා විසින් සප්තබොජ්ඣඞ්ග ධර්මයෝ වඩන ලද්'යි, 'මා විසින් ආර්ය-අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ලද්'යි, කියා නැණවතුන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි</u> නම් වන්නේ ය.

4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් සම්මසනඤාණය වඩන ලද්'යි, 'මා විසින් උදයබ්බයඤාණය වඩන ලද්'යි, 'මා විසින් භඞ්ගානුපස්සනාඤාණය වඩන ලද්'යි, 'මා විසින් භයතුපට්ඨානඤාණය වඩන ලද්'යි, 'මා විසින් ආදීනවානුපස්සනාඤාණය වඩන ලද්'යි, කියා නැණවතුන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි</u> නම් වන්නේ ය.

5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් නිබ්බිදානුපස්සනාඤාණය වඩන ලද්'යි, 'මා විසින් මුඤ්චිතුකම්‍යතාඤාණය වඩන ලද්'යි, 'මා විසින් පටිසඞ්ඛානුපස්සනාඤාණය වඩන ලද්'යි, 'මා විසින් සඞ්ඛාරුපෙක්ඛාඤාණය වඩන ලද්'යි, 'මා විසින් අනුලෝමඤාණය වඩන ලද්'යි, 'මා විසින් ගෝත්‍රභූඤාණය වඩන ලද්'යි, කියා නැණවතුන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද <u>පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි</u> නම් වන්නේ ය.

6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් සෝතාපත්ති මාර්ගය වඩන ලද්'යි, 'මා විසින් සකදාගාමී මාර්ගය වඩන ලද්'යි, 'මා විසින් අනාගාමී මාර්ගය වඩන ලද්'යි, 'මා විසින් අර්හත් මාර්ගය වඩන ලද්'යි, කියා නැණවතුන් විසින් තම

තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි නම් වන්නේ ය.

7. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය 'මා විසින් සෝතාපත්ති ඵලය අධිගමනය කරන ලද්'යි, 'මා විසින් සකදාගාමී ඵලය අධිගමනය කරන ලද්'යි, 'මා විසින් අනාගාමී ඵලය අධිගමනය කරන ලද්'යි, 'මා විසින් අර්හත් ඵලය අධිගමනය කරන ලද්'යි, 'මා විසින් අසඞ්ඛතධාතු නිර්වාණය සාක්ෂාත් කරන ලද්'යි, නැණවතුන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් ද පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි නම් වන්නේ ය.

## 4. කර්මස්ථානය (දහම්ගුණ මෙනෙහි කිරීම)

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ; සන්දිට්ඨිකෝ; අකාලිකෝ; ඒහිපස්සිකෝ; ඕපනයිකෝ; පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී'ති.

1. ස්වාක්ඛාතෝ
2. සන්දිට්ඨිකෝ
3. අකාලිකෝ
4. ඒහිපස්සිකෝ
5. ඕපනයිකෝ
6. පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි

භාග්‍යවත් වූ අර්හත් වූ ඒ සම්මාසම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ජයසිරි මහබෝමැඩ දී අවබෝධ කොට වදාළා වූ සපර්‍යාප්තික නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මරත්නය මුල, මැද, අග යහපත් බැවින් ද, අර්ථ සම්පන්න, ව්‍යඤ්ජන සම්පන්න, සර්ව සම්පූර්ණ, සුපරිශුද්ධ ශාසන බ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ වන බැවින් ද ස්වාක්ඛාත නම් වන්නේ ය.
2. තමා විසින් ම මේ ජීවිතයෙහි දී ම අවබෝධ කළ යුතු බැවින් සන්දිට්ඨික නම් වන්නේ ය.

3. මාර්ග කුසලයට අනතුරු ව ම ඵල විපාක ගෙන දෙන බැවින් අකාලික නම් වන්නේ ය.
4. මෙහි 'එව බලව'යි දක්විය යුතු වූ විද්‍යමාන ගුණ ඇති බැවින් ඒහිපස්සික නම් වන්නේ ය.
5. සතර මාර්ග, සතර ඵල ධර්මයන් උපදවා ගැනීම් වශයෙන් ද, නිර්වාණ ධර්මය අරමුණු කිරීම් වශයෙන් ද උපනයනය කළ යුතු බැවින් ඕපනයික නම් වන්නේ ය.
6. භාවිත ප්‍රඥා ඇති ඥානවන්තයන් විසින් තම තමන්ගේ නැණ පමණින් අවබෝධ කළ යුතු බැවින් පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි නම් වන්නේ ය.

## අනුලෝම

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ස්වාක්ඛාත නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සන්දිට්ඨික නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අකාලික නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ඒහිපස්සික නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ඕපනයික නම් වන්නේ ය.
6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි නම් වන්නේ ය.

## ප්‍රතිලෝම

1. පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි
2. ඕපනයිකෝ
3. ඒහිපස්සිකෝ
4. අකාලිකෝ
5. සන්දිට්ඨිකෝ
6. ස්වාක්ඛාතෝ

<u>ප්‍රතිලෝම</u>

6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි නම් වන්නේ ය.
5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ඕපනයික නම් වන්නේ ය.
4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ඒහිපස්සික නම් වන්නේ ය.
3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය අකාලික නම් වන්නේ ය.
2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය සන්දිට්ඨික නම් වන්නේ ය.
1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නය ස්වාක්ඛාත නම් වන්නේ ය.

## 5. ධම්මානුස්සතියෙන් විදර්ශනාවට

ධම්මානුස්සති භාවනාව වැඩීමෙහි දී පහළ වූ නාම - රූප ධර්මයන් ක්ෂණයක් පාසා ඇති ව-නැති ව ගිය බැවින් අනිත්‍ය ය. ඇති වීම්-නැති වීම් වශයෙන් නිරන්තරයෙන් පීඩාකාරී වූ නාම-රූප දුකට අයත් ය. තමාගේ වසඟයෙහි නො පවතින බැවින් එම නාම-රූප අනාත්ම ය. අනිත්‍ය වූ දුක් වූ අනාත්ම වූ එම නාම-රූප ධර්ම දුක්ඛ-සත්‍යය යි. එම නාම-රූප හටගැනීමට හේතු වූ පූර්ව භවතණ්හාව සමුදය සත්‍යය යි. එම දුක්ඛ - සමුදය දෙකෙහි නො පැවැත්ම වූ නිවන, නිරෝධ-සත්‍යය යි. ඒ නිරෝධය සාක්ෂාත් කිරීම සඳහා වැඩිය යුතු ප්‍රතිපත්ති මාර්ගය, මාර්ග-සත්‍යය යි.

මෙසේ අනේකානිසංස ඇත්තා වූ ධම්මානුස්සති භාවනාව වඩා වහා නිර්වාණධාතුව සාක්ෂාත් කිරීමට සත්පුරුෂයෝ වෑයම් කරත්වා!

**සාධු ! සාධු !! සාධු !!!**

**ධර්මදානය පිණිස යි.**

අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ
ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ
ශ්‍රී සද්ධර්ම සංසදය මගින් ප්‍රකාශිත දහම් පොත්
**www.sadaham.net**
යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.


ප්‍රකාශනය

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
විමසීම් :- 071-4417813
වෙබ් අඩවිය:- www.sadaham.net

පිටු සැකසීම හා මුද්‍රණය

e-Artefacts Technologies

305/5, Hansagiri Road, Gampaha
Tel:- 077-3021777, 071-4417813
Web:- www.eartefacts.com